// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1720/43 – 2011 අගෝස්තු 26 වැනි සිකුරාදා – 2011.08.26

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/21/25/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි නිලධාරීන්ගේ වෘත්තීය සංගමය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, සබරගමුව ප්‍රාදේශීය කාර්යාලය, අංක 28/1, නව නගරය, රත්නපුර

සහ

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, අංක 70 පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් වත්තල, හැඳල, නිමල මරියා මාවත, අංක 33/2 හි, නීතිඥ පාලිත වීරසේකර මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 ජූලි මස 16 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/21/25/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි නිලධාරීන්ගේ වෘත්තීය සංගමය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, සබරගමුව ප්‍රාදේශීය කාර්යාලය, අංක 28/1, නව නගරය, රත්නපුර

සහ

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, අංක 70 පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ,

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි වෙත ලබා දියයුතු උසස්වීම් විධිමත් ආකාරයට ලබා නොදීම හේතුවෙන්, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණීන් වන,

01. VIII ශ්‍රේණියේ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණීන් VII ශ්‍රේණියට උසස් කිරීමේදීද,
02. VII ශ්‍රේණියේ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණීන් VI ශ්‍රේණියට උසස් කිරීමේදීද,
03. VI ශ්‍රේණියේ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණීන් V අධි ශ්‍රේණියට උසස් කිරීමේදීද යම් අගතියක් සිදුවූයේ යයි වෘත්තීය සමිතියේ ඉදිරිපත් කිරීම නිවැරදිද, නිවැරදි නම් ඔවුනට කුමන සහනයක් හිමිද,

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2011 ජුනි මස 28 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

09 - 359

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.